**ටවර්හෝල් රඟහල පදනම - 2020**

-------------------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

-------------------

### 1.1 තත්ත්වාගණනය කළ මතය

--------------------------------

ටවර්හෝල් රඟහල පදනමේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, පදනමේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

----------------------------------------------

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

------------------------------------------------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, පදනම අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය පදනම ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා පදනමේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

පදනමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, පදනමේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්**,**

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන් චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් පදනමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ පදනමේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;
- යම් අදාළ ලිඛිත නීතියකට හෝ පදනමේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, පදනම ක්‍රියා කර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

ගනුදෙනු කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරීබලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම්කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබාගැනීමට ප්‍රමාණවත් "මනාලෙස සැලසුම් කරන ලද" අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් ආයතනය විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ.

### 1.5.2 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| | අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන වල නැවත ප්‍රකාශ කර තිබූ ගිණුම් අයිතම 9ක සංසන්දනාත්මක අගයන් හා ඉකුත් වර්ෂයේ අදාල අගයන් රු.771,107,315 කින් නැවත ගලපා තිබුණි. එසේ වුවත් එකී පෙර වර්ෂ ගැලපීම් නිවැරදිව ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 03 හි 54 ඡේදය ප්‍රකාරව හෙළිදරව් කළ යුතු කරුණු මූල්‍ය ප්‍රකාශන වල හෙළිදරව් කර නොතිබුණි. | ඉදිරියේදි එවැනි නැවත ප්‍රකාශිත සංසන්දනාත්මක අගයන් විස්තර සහිතව ඉදිරිපත් කිරිමට කටයුතු කරන බව කාරුණිකව සඳහන් කරමි. | ප්‍රමිතියේ නියමයන් ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන වල හෙළිදරව් කළ යුතු කරුණු හෙළිදරව් කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 07 හි 49 ඡේදය ප්‍රකාරව දේපළ පිරියත හා උපකරණ පන්තිය මුළුමනින්ම ප්‍රත්‍යාගණනය කළ යුතු වුවද, 2016 වර්ෂයේදී පැවති ඉඩම් හා ගොඩනැගිලි වලින් ප්‍රධාන කාර්යාලීය ඉඩම හා ගොඩනැගිලි පමණක් පිළිවෙලින් රු.614,000,000 කට හා රු.163,000,000 කට ප්‍රත්‍යාගණනය කර තිබූ අතර 2020 දෙසැම්බර් 31 දිනට අගය රු.328,000,000ක් වූ ඉඩම් 2ක් හා රු.400,360,931 ක් වූ ගොඩනැගිලි 4ක් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් ප්‍රත්‍යාගණනය කර නොතිබුණි. | මෙම ප්‍රත්‍යාගණන කටයුතු සඳහා මූලික කටයුතු සිදු කර ඇති අතර රජයේ තක්සේරු දෙපාර්තමේන්තුව වෙත අවශ්‍ය ලිපි යොමු කර ඇත. ඒ අනුව 2022 ජුනි 30ට පෙර මෙම ප්‍රත්‍යාගණනය අවසන් කිරීමට කටයුතු කර ඇති බව කාරුණිකව සඳහන් කරමි. ප්‍රධාන කාර්යාලීය අප සතු දේපලක් වුවත් 30 වසරක් බදු පදනම මත දී තිබූ බැවින් ප්‍රත්‍යාගණනය කටයුතු සිදු කර නොමැත. | ප්‍රමිතයේ නියමයන් අනුව වත්කමක් අයත්වන දේපළ පිරියත හා උපකරණ පන්තිය මුළුමනින්ම ප්‍රත්‍යාගණනය කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරන ප්‍රමිත අංක 07 ප්‍රකාරව වත්කමක සාධාරණ අගය ගිණුම් වලින් නිරූපණය කල යුතු වුවද ඒ අනුව කටයුතු නොකිරීම හේතුවෙන් සම්පූර්ණයෙන් ක්ෂය කරන ලද එහෙත් තවමත් භාවිතයට ගන්නා පිරිවැය රු.34,833,215ක් වූ වාහන 08 ක ඵලදායි ජීවිත කාලය පිළිබඳව වූ ඇස්තමේන්තුගත ශේෂය නැවත ගිණුම් වල ගැලපීමට කටයුතු කර නොතිබුණි. | පිළිගනිමි. 2022 වසරේ ප්‍රත්‍යාගණන කටයුතු සිදු කිරීමෙන් පසු ගිණුම් ගත කිරීමට කටයුතු සිදු කරන බව කාරුණිකව සඳහන් කරමි. | ප්‍රමිතයේ නියමයන් ප්‍රකාරව වත්කම්වල සාධාරණ අගය මූල්‍ය ප්‍රකාශනවල දැක්වීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 15හි 14 ඡේදය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශනවල අයවැය ලේඛනයේ වටිනාකම් හා සත්‍ය වටිනාකම් අතර සැසඳීමක් ඇතුලත් කර හෝ අයවැය ලේඛනයේ වටිනාකම් හා සත්‍ය වටිනාකම් අතර වන ප්‍රමාණාත්මක වෙනස්කම් සඳහා හේතු පැහැදිලි කර නොතිබුණි. | 2021 වර්ෂයේ අවසන් ගිණුම් සකස් කිරීමේදි ගිණුම්කරණ ප්‍රමිත 15හි 14 ඡේදය අනුව කටයුතු කරන බව කාරුණිකව සඳහන් කරමි. | ප්‍රමිතයේ නියමයන් ප්‍රකාරව අයවැය ලේඛනය සහ සත්‍ය වටිනාකම් අතර වෙනස්කම් සැසඳීමට සහ ඒ සඳහා හේතු පැහැදිලි කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඉ) | 2018 වර්ෂයේ අධ්‍යාපන අමාත්‍යාංශය විසින් පරිත්‍යාග කර තිබූ කැබ් රථයක වටිනාකම 2019 ජනවාරි 01 දින ගිණුම්ගත කිරීමේදී ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරන ප්‍රමිත අංක 07 හි 25 හා 43 ඡේද ප්‍රකාරව වත්කම අත්පත් කරගත් දිනට පැවති සාධාරණ වටිනාකම | එය එම වර්ෂයේදි දැනුම මදි කමින් සිදු වූ දෝෂයක් බව පිළිගනිමි. මේ වන විට තක්සේරු දෙපාර්තමේන්තුව විසින් ප්‍රත්‍යාගණන කටයුතු සිදු කරන අතර එය අප්‍රේල් අග වන විට අවසන් කිරීමට හැකි බව | ප්‍රමිතවල සඳහන් නියමයන් අනුගමනය කරමින් වත්කම් වල සාධාරණ අගය මූල්‍ය ප්‍රකාශනවල |

| | | |
|---|---|---|
| වෙනුවට 2017 වර්ෂයේ රක්ෂණ කටයුතු සඳහා අගය කළ වටිනාකම වූ රු.4,000,000 පිරිවැය ලෙස සලකා ගිණුම්ගත කර තිබුණි. | කාරුණිකව සඳහන් කරමි. | දැක්වීමට කටයුතු කළ යුතුය. |

### 1.5.3 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2020 ජනවාරි 01 දිනට පිරිවැය රු.161,750,000ක් වූ ප්‍රධාන කාර්යාලීය ගොඩනැගිල්ල හා රු.1,250,000ක් වූ ශබ්දාගාරය 2017 වර්ෂයේ සිට ක්ෂය කර නොතිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ක්ෂය වියදම රු.16,300,000ක් හා සමුච්චිත ක්ෂය රු.65,200,000ක් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දැක්වුණි. මේ හේතුවෙන් වර්ෂයේ ඌනතාවය රු.16,300,000ක් අඩුවෙන් හා සමුච්චිත ලාභය රු.48,900,000ක් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශන වල දැක්වුණි | පිලිගනිමි. අප සතු දේපලක් වුවත් 30 වසරක් බදු පදනම මත දී තිබු බැවින් ප්‍රත්‍යාගණන කටයුතු සිදු කර නොමැත. නමුත් 2022 වසරේ ප්‍රත්‍යාගණන කටයුතු සිදු කිරිමෙන් පසු ක්ෂය කිරිම් කටයුතු සිදු කරන බව කාරුණිකව සඳහන් කරමි. | වත්කම්වල ක්ෂය වියදම නිවැරදිව හඳුනාගෙන ගිණුම්වල දැක්වීමට කටයුතු කළ යුතුය. |

### 1.5.4 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විෂය | මුදල රු. | නොසැපයූ විගණන සාක්ෂි | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| **සංචිත** | 79,091,701 | වසර ගණනාවක් තිස්සේ ඉදිරියට ගෙන එන ගිණුම් ශේෂ 5ක් පිළිබඳ තොරතුරු/ ලිපිගොනු/ ලේඛන | ටවර් හෝල් රඟහල පදනමේ මුල් කාලවකවානු තුල සිට එම ශේෂයන් ගිණුම් පොත් වල සටහන්ව ඇත. එම ශේෂයන්ට අදාලව කිසිදු ලියකියවිල්ලක් හෝ තොරතුරු සොයා ගත නොහැකි අතර කිසිදු සාක්ෂියක්ද සොයා ගත නොහැකි බව කාරුණිකව සඳහන් කරමි. | විගණනය සඳහා අවශ්‍ය සාක්ෂි ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුය. |

## 1.5 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 1978 අංක 1 දරන ටවර්හෝල් රඟහල පදනම පනතේ 8 වෙනි වගන්තිය හා පදනම සතු සව්සිරිපාය ගොඩනැගිල්ල සහ එය පිහිටි භූමිභාගය පදනම වෙත පවරාදීමට අදාල 1980 ඔක්තෝබර් 08 දිනැති විශේෂ දීමනා පත්‍රයේ නියමයන් | මෙම ඉඩම හා එහි පිහිටි ගොඩනැගිලි ජාතික නෘත්‍ය කටයුතු දිරිගැන්වීම සහ ප්‍රවර්ධනය කිරීමට අවශ්‍ය කාර්යන් සඳහා මිස වෙනත් කාර්යයන් සඳහා නොයෙදවිය යුතු බවත් එම කාර්යයන් සඳහා නොයෙදවන ලද්දේ නම් එවිට එය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයට පෙරලා පැවරෙනු ඇති බවත් සඳහන් වී තිබුණද පදනම සතු සව්සිරිපාය ගොඩනැගිල්ල හා එය පිහිටි භූමිභාගය ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියට බදු දී තිබුණි.<br><br>ඉකුත් බදු ගිවිසුම 2016 මැයි 15 දින අවසන් වී තිබූ අතර එම අධිකාරිය දිගින් දිගටම ගොඩනැගිල්ලේ රැඳී සිටියද 2016 මැයි 15 සිට 2021 දෙසැම්බර් 31 දක්වා කිසිදු බදු කුලියක් පදනම වෙත අය වී නොතිබුණි. | සව්සිරිපාය ගොඩනැගිල්ල සම්බන්ධව පැවති ගැටළුකාරි තත්වය නිරාකරනය කර ගැනීම සඳහා දෙපාර්ශවයේ නිලධාරීන් හා අග්‍රාමාත්‍යතුමා තුමා සමග කරන ලද සාකච්ඡාවට අනුව බදු ගිවිසුම අලුත් කර ගැනිමට හා බදු මුදල් අයකර ගැනිමට අවශ්‍ය කටයුතු සිදු කිරිම සඳහා ඉදිරි භාරකාර මණ්ඩලය වෙත ඉදිරිපත් කිරිමට කටයුතු කරන බව කාරුණිකව සඳහන් කරමී. | බදු ගිවිසුම අළුත් කිරීමට සහ කඩිනමින් හිඟ බදු මුදල් අය කර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | 1971 අංක 38 දරන මුදල් පනතේ 13(8) වගන්තිය | 2019 වර්ෂය සඳහා මුදල් පනතේ 13(7)(ඒ) වගන්තිය ප්‍රකාර කළමනාකරණ විගණන වාර්තාව භාරකාර මණ්ඩලය විසින් සලකා බලා එහි ඇති කරුණු සම්බන්ධව ගැනීමට | පිලිගනිමි. ඉදිරි වාර්තාව සඳහා පිලිතුරු මාස 03 ක් තුල විගණකාධිපති වෙත දන්වා එවීමට කටයුතු කරන බව කාරුණිකව සඳහන් කරමී. | මුදල් පනතේ 13(7)(ඒ) වගන්තිය ප්‍රකාරව කළමනාකරණ විගණන වාර්තාවේ කරුණු සම්බන්ධයෙන් ගැනීමට යෝජිත |

| | | | | |
|---|---|---|---|---|
| | | යෝජිත පියවර මාස 03 ක් තුල විගණකාධිපති වෙත දන්වා නොතිබුණි. | | පියවර විගණකාධිපති වෙත දැනුම් දිය යුතුය. |
| (ඇ) | 2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ 20(1) හා 102 වගන්ති | පදනම 2018/2019 හා 2019/2020 තක්සේරු වර්ෂ සඳහා ආදායම් බදු ගෙවීමට කටයුතු කර නොතිබූ අතර ආදායම් බදු සඳහා ලියාපදිංචි වීමට හෝ බදු නිදහස් කර ගැනීමටද කටයුතු කර නොතිබුණි. | ටවර් හෝල් රඟහල පදනම බදු නිදහස් ආයතනයක් වන අතර ඒ පිලිබඳ පනතෙහි සඳහන්ව ඇත. | දේශීය ආදායම් පනත ප්‍රකාරව බදු නිදහස් කර ගැනීමට හෝ බදු සඳහා ලියාපදිංචි වීමට කටයුතු කළ යුතුය. |
| (ඈ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ VIII වැනි පරිච්ඡේදයේ 6.1 ඡේදය | පදනමේ සේවකයන්ගේ පැයක අතිකාල අනුපාතය පැය 1ට පැය 1½ ක් ලෙස තීරණය කර එම අනුපාතය මත 2018 අප්‍රේල් 11 දිනැති අංක 02/2016(ii) දරණ කළමනාකරණ සේවා චක්‍රලේඛයේ 02(i)(අ) ඡේදයට පටහැනිව 2016 ජනවාරි 01 දින සිට 2018 අප්‍රේල් 11 දක්වා හිඟ අතිකාල ලෙස රු.1,438,435 ක් අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ අනුමැතිය මත සේවකයින් 51 දෙනෙකුට 2019 මාර්තු 08 දින ගෙවා තිබුණි. මෙම හිඟ අතිකාල ගෙවීම සඳහා 2019 මාර්තු 15 දින භාරකාර මණ්ඩලයේ ආවරණ අනුමැතිය ලබා දී තිබුණද කළමනාකරණ සේවා අධ්‍යක්ෂ විසින් ගෙවූ හිඟ අතිකාල අනුමත කිරීම ප්‍රතික්ෂේප කර තිබුණි. | කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ විසින් මෙම ගෙවූ අතිකාල සඳහා අනුමැතිය ලබානොදුන් බැවින් එම ගෙවූ මුදල් අයකර ගනිමින් පවතී. 2020.08.27 ලිපියෙන් සැප්තැම්බර් මස සිට ගෙවන ලද හිඟ අතිකාල අයකරගෙන ඇතත් කාර්ය මණ්ඩලය විසින් ඉදිරිපත් කර ඇති 2020-09-18 ලිපිය අනුව අධ්‍යක්ෂ ජනරාල් විසින් දන්වා ඇති පරිදි ඔක්තෝබර් මස සිට මේ දක්වා වාරික වශයෙන් ගෙවූ අතිකාල මුදල් අයකර ගනිමින් පවතී. | ආයතන සංග්‍රහයේ නියමයන් ඉක්මවූ මෙවැනි ගෙවීම් භාරකාර මණ්ඩලයේ හා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු පූර්ව අනුමැතිය මත සිදුකළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඉ) ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| (i) මුදල් රෙගුලාසි 119(1), 119(2) සහ 233 | අනුමැතියකින් තොරව සේවකයින් 51 දෙනෙකුට 2019 මාර්තු 08 දින ගෙවන ලද අතිකාල රු.1,438,435ක් ආපසු අයකර ගැනීම 2020 ඔක්තෝබර් දක්වා පමා කර තිබුණි. ආපසු අයකරගත ගන්නා වාරික ගණන 12 ඉක්මවන පරිදි අයකර ගැනීමට බලය දිය හැකි වන්නේ අමාත්‍යාංශ ලේකම්වරයාට වුවද, අනුමැතියෙන් තොරව ගෙවන ලද අතිකාල වාරික 48 ක් දක්වා අයකර ගැනීමට අධ්‍යක්ෂ ජනරාල්වරයා අවසරදී තිබුණ අතර 2020 දෙසැම්බර් 31 දින වන විට සේවකයන් 30 දෙනෙකුගෙන් අයවිය යුතු රු.1,027,596ක ශේෂයක් තවදුරටත් අයවිය යුතුව පැවතුණි. | පිළිගනිමි. | අනුමැතියෙන් තොර හා සාවද්‍ය ලෙස ගෙවන ලද අතිකාල මුදල් රෙගුලාසි ප්‍රකාරව අය කර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ii) මුදල් රෙගුලාසි 396 | නිකුත් කර මාස 06 ක් ඉක්මවූ වටිනාකම රු.124,430ක් වූ චෙක්පත් 15ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි | මේ වන විට එම චෙක්පත් සම්බන්ධව මුදල් රෙගුලාසි 396 ප්‍රකාරව කටයුතු කර ඇති බව කාරුණිකව දන්වා සිටිමි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව මාස 06 ඉක්මවූ චෙක්පත් වහාම ආදායමට ගැනීමට කටයුතු කළ යුතුය. |
| (iii) මුදල් රෙගුලාසි 880 සිට 893 දක්වා සහ 612 වැනි අධිකාරිය මත වූ රජයේ | ඇප තැබිය යුතු නිලධාරීන් හඳුනාගෙන ඇප ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි. | ඇප තැබිය යුතු නිලධාරීන් සම්බන්ධව උපදෙස් පතා ලේකම්තුමිය වෙත ලිපියක් යොමුකොට ඇත. ඉදිරියේදී ඒ උපදෙස් අනුව කටයුතු කරන බව කාරුණිකව සඳහන් කරමි. | මුදල් රෙගුලාසි සහ රජයේ ඇප ආඥා පනත අනුව ඇප ලබා ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| නිලධාරින්ගේ ඇප ආඥා පනත | | | |
| (ඊ) 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී-12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | | | |
| (i) 4.2.6 වගන්තිය | 2020 කාර්තුමය, අර්ධ වාර්ෂික හා වාර්ෂික කාර්යසාධන වාර්තා භාරකාර මණ්ඩලය වෙත ඉදිරිපත් කර නොතිබුණි. | භාරකාර මණ්ඩල රැස්වීම් නොපැවැත්වීම හේතුවෙන් භාරකාර මණ්ඩල අනුමැතිය සහිතව 2020 වාර්ෂික අයවැය ඉදිරිපත් කිරිම ප්‍රමාද වු බව කාරුණිකව සඳහන් කරමි. | චක්‍රලේඛ නියමය ප්‍රකාරව කාර්යසාධන වාර්තා ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුයි. |
| (ii) 5.1.3 හා 5.2.1 වගන්ති | 2020 අයවැය වාර්තාව විගණකාධිපති වෙත ඉදිරිපත් කර තිබුණේ 2021 ජුලි 28 දිනදී වන අතර අයවැය ලේඛනය සමග අයවැයගත විස්තීර්ණ ආදායම් ප්‍රකාශය, අයවැයගත මූල්‍ය තත්ත්ව ප්‍රකාශය හා අයවැයගත මුදල් ප්‍රවාහ ප්‍රකාශය ඉදිරිපත් කර නොතිබුණි. | චක්‍රලේඛ අනුව ඉදිරියේදි අවශ්‍ය ලේඛණ සමඟ අයවැය ලේඛනය ඉදිරිපත් කිරිමට කටයුතු කරන බව කාරුණිකව සඳහන් කරමි. | චක්‍රලේඛ නියමය ප්‍රකාරව අයවැය ලේඛනය සමග අනිකුත් ලේඛන ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුය. |
| (iii) 6.5.1 වගන්තිය | 2020 ගිණුම් විගණකාධිපති වෙත ඉදිරිපත් කර තිබුණේ 2022 ජනවාරි 12 දිනදීය. | භාරකාර මණ්ඩල රැස්වීම් නොපැවැත්වීම හේතුවෙන් භාරකාර මණ්ඩල අනුමැතිය සහිතව 2020 ගිණුම් විගණකාධිපති වෙත ඉදිරිපත් කිරිම ප්‍රමාද වු අතර 2022 වර්ෂයේ සිට නොපමාව ඉදිරිපත් කරන බව කාරුණිකව සඳහන් කරමි. | චක්‍රලේඛ නියමය ප්‍රකාරව ගිණුම් ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුය. |
| (iv) 6.5.3 වගන්තිය | 2018 සහ 2019 වර්ෂවල වාර්ෂික වාර්තා 2022 ජනවාරි 31 වන විටත් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි. | 2018 වර්ෂයට අයත් වාර්ෂික වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කිරීමේ කටයුතු අවසන් කර ඇති අතර 2019 වර්ෂයට අයත් වාර්ෂික වාර්තාව මේ වන විට අමාත්‍ය | චක්‍රලේඛ නියමය ප්‍රකාරව වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවේ සභාගත කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | මණ්ඩලයට ඉදිරිපත් කිරිම සඳහා අමාත්‍යාංශය වෙත භාර දී ඇති බව කාරුණිකව සඳහන් කරමි. | |
| (iv) 7.3 වගන්තිය | භාරකාර මණ්ඩලයේ අනුමැතිය මත 1997 සිට ක්‍රියාත්මක කර තිබුණු පදනමේ අත්පොත සඳහා රේඛීය අමාත්‍යාංශයේ අනුමැතිය හා භාණ්ඩාගාර එකඟතාවය ලබාගෙන නොතිබුණි. | මේ දක්වා අත්පොත ප්‍රකාරව කටයුතු කර ඇත. වර්තමානයේදි භාණ්ඩාගාරය විසින් එවැනි අත්පොත් සඳහා අනුමැතිය ලබා නොදෙන බැවින් ඉදිරියේදි ආයතන සංග්‍රහය හා වරින් වර නිකුත් චක්‍රලේඛ අනුව සිදු කරන බව කාරුණිකව සඳහන් කරමි. | අත්පොත සඳහා රේඛීය අමාත්‍යාංශයේ අනුමැතිය හා භාණ්ඩාගාර එකඟතාවය ලබා ගැනීමට කටයුතු කළ යුතුය. |
| (උ) 2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 04 වගන්තිය | 2020 ක්‍රියාකාරි සැලැස්ම හා ඒ සමඟ ඇතුලත් කල යුතු ක්‍රියාකාරකම් සැලැස්ම, ප්‍රසම්පාදන සැලැස්ම හා අභ්‍යන්තර විගණන සැලසුම විගණකාධිපති වෙත ඉදිරිපත් කරන ලද්දේ 2021 ජුනි 28 දිනදීය. | ඉදිරියේදි රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 01/2014 ප්‍රකාරව කටයුතු කරන අතර 2022 වර්ෂයට මේ වන විට ක්‍රියාකාරි සැලැස්ම සඳහා අභ්‍යන්තර විගණන සැලැස්ම ඉදිරිපත් කර ඇති බව කාරුණිකව සඳහන් කරමි. | චක්‍රලේඛ නියමයන් ප්‍රකාරව ක්‍රියාකාරි සැලැස්ම ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඌ) 2008 දෙසැම්බර් 31 දිනැතිඅංක 142 දරන අයවැය චක්‍රලේඛයේ 5.2(III) වගන්තිය | 2020 වර්ෂය තුල සේවකයන් 16 කට රු.250,000 සීමාව ඉක්මවා ආපදා ණය රු.2,088,106 ක් ගෙවා තිබුණි. ආපදා ණය ගෙවීම සඳහා අයවැය මගින් භාරකාර මණ්ඩලය අනුමත කර තිබු ප්‍රමාණය රු.2,481,987කින් ඉක්මවන පරිදි 2020 වර්ෂයේ ආපදා ණය ගෙවා තිබුණි. | මෙම වර්ෂයේ සිට ලබාදෙනු ලබන ආපදා ණය මුදල උපරිම සීමාව රු.250,000.00 යටත්ව ලබාදීමට අවශ්‍ය කටයුතු කරන බව කාරුණිකව සඳහන් කරමි.<br>අයවැය ලේඛණය ඉක්මවා නොයන ලෙසත් කටයුතු කිරීමට අවශ්‍ය කටයුතු කරන බව කාරුණිකව සඳහන් කරමි. | චක්‍රලේඛ නියමයන් පරිදි ආපදා ණය ගෙවීමට කටයුතු කළ යුතුය. |
| (එ) 2020 ජුනි 10 දිනැති අංක 07/2020(iii) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | වසරකට මාසික වාරික 02 ක් අඩුවෙන් සේවක ණය අයකරගෙන තිබු අතර 2020 වර්ෂයේ රු.274,504 ක් අඩුවෙන් ණය ආපසු අයවී තිබුණි. | උත්සව මාසයක් නිසා භාරකාර මණ්ඩලයේ අනුමැතිව ඇතිව ආපදා ණය වාරිකය අයකර නොගත් බවත් මින් ඉදිරියට එම වැරද නිවැරදි කර මෙම වර්ෂයේ අප්‍රේල් මස සිට නියමිත පරිදි | චක්‍රලේඛ නියමයන් පරිදි ආපදා ණය නොකඩවා ආපසු අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| | අයකර ගැනීමට කටයුතු කරන බවත් හිග වාරික පිලිබද භාරකාර මණ්ඩල උපදෙස් පරිදි ඉදිරියේදි කටයුතු කරන බවත් කාරුණිකව සදහන් කරමි. | |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.96,531,981 ක ඌණතාවයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌණතාවය රු.30,481,863 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.66,050,118 ක පිරිහීමක් නිරීක්ෂණය විය. පුනරාවර්තන වියදම් සඳහා රජයේ දායකය රු.13,400,000 කින් වැඩි වුවද ශාලා කුලී ආදායම් රු.13,199,166 කින් සහ පොලී ආදායම් රු.1,428,658 කින් අඩුවීමත් වැටුප් හා වේතන රු.4,726,839 කින් සහ ක්ෂය වියදම රු.57,554,889 කින් වැඩිවීමත් මෙම පිරිහීමට ප්‍රධාන වශයෙන් හේතු විය.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 1978 අංක 01 දරන ටවර් හෝල් රඟහල පදනම පනත කාලානුරූපීව සංශෝධනය කර ගැනීමට පියවර ගෙන නොතිබුණි. | මෙ වන විට පනත සංශෝධන කටයුතු සිදු කිරිම සඳහා කමිටුවක් පත් කර ඇති බව කාරුණිකව සදහන් කරමි. | පනත කාලානුරූපීව සංශෝධනය කර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | රු.3,000ක්ව පැවති කලාකරු විශ්‍රාම වැටුප් දීමනාව 2019 මාර්තු 15 දිනැති අංක 2019/294/03/01 දරණ භාරකාර මණ්ඩල තීරණය මගින් රු.7,500 දක්වා වැඩි කර තිබුණද ඒ සඳහා අවශ්‍ය වන අතිරේක මුදල් සපයා ගැනීමට කිසිදු උපාය මාර්ගයක් හඳුන්වා දී නොතිබුණි. මේ හේතුවෙන් ජනාධිපති සුභසාධන අරමුදලේ පොලී ආදායම රු.6,254,181ක්ව තිබියදී කලාකරුවන්ට රු.9,268,500 ක් ගෙවීමට සිදුවීමෙන් රු.3,014,319ක හිඟ මුදල පියවා ගැනීමට වෙනත් ආදායමක් භාවිතා කිරීමට සිදුව තිබුණි. | හිග මුදල් සපුරා ගැනීම සඳහා කිසිදු යෝජනාවක් හෝ ක්‍රියාමාර්ගයක් එවක අධ්‍යක්ෂ ජනරාල් විසින් ඉදිරිපත් කර නොමැති අතර එවැනි කිසිදු සටහනක් ආයතනය තුලින්ද සොයාගත නොහැක. එවක අධ්‍යක්ෂ මණ්ඩලය මෙම යෝජනා අනුමත කර ඇත්තේ දේශපාලන බලපෑමක් මත විනා පැහැදිලි වැඩ පිලිවෙලක් මත නොවන බව සදහන් කරමි. එවැනි අවිධිමත් වැඩ කිරිම් ඉදිරියේදි සිදු නොකිරිමට වග බලා ගනිමු.<br>ස්ථාවර තැන්පතු පොලි ආදායම අඩු වුවත් වියපත් කලාකරුවන් සඳහා | භාරකාර මණ්ඩලය මෙවැනි අවිචාරවත් තීරණ ගැනීමෙන් වැලකිය යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | මාසිකව දීමනාව නොකඩවා ගෙවීම් කර ඇත. ගෙවීමේදි ඇති වන හිග මුදල පදනම සතුව ඇති ස්ථාවර තැන්පතු පොලි ආදායමින් පියවා ගැනීමට කටයුතු කර ඇති බව කාරුණිකව සදහන් කරමී. | |

**3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | පදනමට අයත් රඟහල් සහන මිලට ලබාදීම සම්බන්ධයෙන් ප්‍රතිපත්තියක් ඇති කරගෙන නොතිබූ අතර ඒ සඳහා අධ්‍යක්ෂ ජනරාල් විසින් අනුමැතිය ලබාදී පසුව භාරකාර මණ්ඩලයේ ආවරණ අනුමැතිය ලබාගෙන තිබුණි. සමාලෝචිත වර්ෂයේ හා ඉකුත් වර්ෂයේ අවස්ථා 10කදී රඟහල් සහන මිලට ලබාදීම හේතුවෙන් රු.789,000ක හා අවස්ථා 3කදී ගාස්තු අය නොකර ලබාදීම හේතුවෙන් රු.252,500 ක කුලී ආදායමක් අහිමි වී තිබුණි. | ඉදිරියේදි රගහල් සහන කුලියට ලබා දීමේදි ප්‍රතිපත්තියක් අනුව කටයුතු කිරීමට හා ඒ සඳහා පූර්ව භාරකාර මණ්ඩල අනුමැතියක් ලබා ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරන බව කාරුණිකව සඳහන් කරමි. | රඟහල් සහන මිලට ලබාදීම සම්බන්ධයෙන් ප්‍රතිපත්තියක් ඇති කර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ කාර්යසාධන වාර්තාව ක්‍රියාකාරී සැලසුමට අනුකූලව පිළියෙල කර නොතිබුණි. කාර්යසාධන වාර්තාවේ භෞතික ප්‍රගතිය දැක්වීමේදී ළඟාකරගත් ප්‍රතිශතය පමණක් දක්වා තිබූ අතර භෞතික ඉලක්ක හා භෞතික ප්‍රගතිය ඒකක වලින් දක්වා නොතිබීම හේතුවෙන් දක්වා තිබූ කාර්යසාධනය විගණනයට තහවුරු කරගත නොහැකි විය. | වර්ෂයේ කාර්ය සාධනය ඇතුළත් 2021 වාර්තාව, ක්‍රියාකාරී සැලැස්මට අනුකූලව පිළියෙල කිරීමට අවශ්‍ය කටයුතු සිදුකර ඇති බව කාරුණිකව සඳහන් කරමි . | කාර්යසාධන වාර්තාව ක්‍රියාකාරී සැලසුමට අනුකූලව, භෞතික ඉලක්ක හා භෞතික ප්‍රගතිය දක්මින් පිළියෙල කළ යුතුය. |
| (ඇ) | නාඩගම් ගී ඇතුලත් සංයුක්ත තැටියක් නිර්මාණය කිරීමේ ව්‍යාපෘතිය සඳහා 2018 - 2020 වර්ෂ සඳහා එකතුව රු.1,603,450 ක් ඇස්තමේන්තු කර 2018 සහ | නාඩගම් ගී ඇතුළත් සංයුක්ත තැටියක් එළිදැක්වීම හා තෝරාගත් සිංහල නාට්‍ය පිටපත් දෙමළ භාෂාවට පරිවර්තනය කිරීම සහ ඡායාරූප සංරක්ෂණය හා ප්‍රදර්ශනය යන වැඩසටහන් ත්‍රිත්වයට අදාළ මූලික | සැලසුම් ප්‍රකාරව ව්‍යාපෘති කාර්ය නිම කිරීමට |

| | | |
|---|---|---|
| 2019 වර්ෂ වල පිළිවෙලින් රු.61,665ක් හා රු.187,911ක් වශයෙන් එකතුව රු.249,576 ක් වැය කර තිබුණද 2022 ජනවාරි 31 වන විටත් කාර්ය නිමකර සංයුක්ත තැටිය එළිදැක්වීමට කටයුතු කර නොතිබුණි. | කටයුතු වල සිට මුද්‍රණය දක්වා අවශ්‍ය කටයුතු සම්පාදනය කර ඇතත්, ආයතනය තුළ පැවති මුල්‍යමය අර්බුදය හේතුවෙන් අදාළ ගෙවීම් කටයුතු සිදු නොවුණි. | කටයුතු කළ යුතුය. |

**3. 3 මානව සම්පත් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2020 දෙසැම්බර් 31 දිනට තනතුරු 11කට අදාලව පුරප්පාඩු 22ක් පැවති අතර ඉන් පුරප්පාඩු 13ක් පදනමේ තාක්ෂණික ගණ වල කාර්ය මණ්ඩලය සඳහා විය. ඉකුත් වර්ෂයේ හා සමාලෝචිත වර්ෂයේ බඳවාගැනීම් 21 භාරකාර මණ්ඩල ආවරණ අනුමැතිය මත සිදුකර තිබූ අතර අභ්‍යන්තර බඳවාගැනීම් 07කින් බඳවා ගැනීම් 03ක් සඳහා මණ්ඩලීය අනුමැතිය ලබා දී නොතිබුණි. | එම අභ්‍යන්තර බඳවා ගැනිම් 03 සඳහා අනුමැතිය ලබා ගැනිමට 2020.02.12 දින 2020/295/03/37 භාරකාර මණ්ඩල පත්‍රිකාව ඉදිරිපත් කර ඇත. එහිදි මතු වු ගැටළු තත්වයක් මත 2015 න් පසු පදනමේ සිදුකර ඇති පත් කිරීම් සම්බන්ධයෙන් සොයා බැලීමට විමර්ශන කමිටුවක් භාරකාර මණ්ඩලය විසින් පත්කර ඇති අතර එම කමිටුව විසින් ලබාදීමට නියමිත වාර්තාවට අනුව ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු යොදා ඇත. | බඳවා ගැනිම් විනිවිද භාවයකින් යුතුව සිදු කිරීමට කටයුතු කළ යුතුය. |